# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk* *e-mail : info@slelections.gov.lk*


| | | |
|---|---|---|
| මගේ අංකය : PRE/2024/09 | ඔබේ අංකය : | දිනය : 2024.08.01 |
| எனது இல. | உமது இல. | திகதி |

චක්‍රලේඛ අංක - .PRE/2024/22

ඉතා වැදගත්

**සියළුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්/ දිස්ත්‍රික් ලේකම් කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම හා සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**ජනාධිපතිවරණය - 2024**
**වලංගු හැඳුනුම්පතක් ඉදිරිපත් නොකරන කිසිදු අයකුට තැපෑලෙන් ඡන්ද දීම සඳහා අවකාශය ලබා නොදීම.**

තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා, පහත සඳහන් පිළිගන්නා වූ හැඳුනුම්පතක් ඉදිරිපත් කර අනන්‍යතාව තහවුරු කිරීම අනිවාර්යය අවශ්‍යතාවයකි.

පිළිගන්නා වූ හැඳුනුම්පත්

1. ජාතික හැඳුනුම්පත
2. වලංගු රියදුරු බලපත්‍රය
3. වලංගු විදේශ ගමන් බලපත්‍රය
4. ජාතික හැඳුනුම්පත වෙනුවට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන තොරතුරු තහවුරු කිරීමේ ලිපිය
5. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත

02. ඉහත සඳහන් කිසිදු හැඳුනුම්පතක් හෝ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් වන රාජකාරි හැඳුනුම්පත හෝ නොමැති කිසිවෙකුට තම අනන්‍යතාව සනාථ කළ නොහැකි බැවින් තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ දී වුව ද ඡන්දදායකයකු ලෙස සලකා කටයුතු නොකළ යුතුය.

03. රාජකාරි හැඳුනුම්පත තැපැල් ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පිළිගනු ලැබුව ද පසුගිය ඡන්ද විමසීම්වලින් පසුව ඒ සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගෙන, මෙම ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්දදායකයකු රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම් තැපැල් ඡන්දදායකයා හඳුනා ගැනීම හෙවත් අනන්‍යතාව පරීක්ෂා කිරීම සහතික කිරීමේ නිලධාරී කාර්යාලවල කටයුතු අධීක්ෂණයට තේරීම්භාර නිලධාරී විසින් පත්කොට ඇති නිලධරයා විසින් කළ යුතු වේ. එසේ නොවන අවස්ථාවල රාජකාරි හැඳුනුම්පතට තැපැල් ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා අවස්ථාව ලබා නොදිය යුතු බව, ඔබ විසින් තැපැල් ඡන්ද නිරීක්ෂණ කටයුතු සඳහා යොදවන සහකාර තේරීම්භාර නිලධාරීන්/ වෙනත් නිලධාරීන් මඟින් තැපැල් ඡන්ද කටයුතු ආරම්භ කිරීමට පෙර සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කිරීමට පියවර ගත යුතුය.

04. මේ පිළිබඳව උපදෙස් පන්තිවලදී සහ ලිපි මඟින් සියලුම සහතික කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන ලෙසත්, මැතිවරණ කොමිෂන් සභාවේ තාවකාලික හැඳුනුම්පත ඇතුළු පිළිගන්නා වූ හැඳුනුම්පත් කිසිවක් හෝ නොමැති අයෙකුට, තැපෑලෙන් ඡන්දය දීමේ අවස්ථාව අහිමි වන බවත්, ඒ අනුව ක්‍රියාකරන ලෙසට අදාළ සියලු පාර්ශව දැනුම්වත් කරන ලෙසත් දන්වමි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත :- ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැන ගැනීම සඳහා කාරුණිකව

Z:\Thakshila\Thakshila\ජනාධිපතිවරණය 2024\තැපැල් ඡන්දය\වලංගු හැඳුනුම්පතක්.doc